IBSL
INSURANCE
BOARD OF SRI LANKA

INSURANCE BOARD OF SRI LANKA
(Established under Act No. 43 of 2000)

Level 11, East Tower, World Trade Centre, Echelon Square, Colombo 1.
Tel. General : +94 11 2396184-9, Fax : +94 11 2396190 Website : www.ibsl.gov.lk

# පුවත්පත් නිවේදනය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය – 2012 වසර පළමු අර්ධය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (පනත) ප්‍රකාරව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සමගින් ලියාපදිංචි වී ඇති රක්ෂණකරුවන් විසි දෙකක් (22) අතුරින් දොළහක් (12) සංයුක්ත සමාගම් ද (සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මෙන්ම දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය කරනු ලබන), හතක් (07) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සිදුකරගෙන යාම පිණිස ලියාපදිංචි වී ඇති සමාගම් ද, තුනක් (03) දීර්ඝ කාලීන (ජීවිත) රක්ෂණ ව්‍යාපාරවල පමණක් යෙදී සිටින සමාගම් ද වේ. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සිදුකිරීම පිණිස ලියාදිංචි වී ඇති එක් සමාගමකට 2009 අගෝස්තු 05 වන දින සිට රක්ෂණ ව්‍යාපාර වල යෙදීම තහනම් කරන ලදී.

2012 ජූනි 30 දක්වා වූ මාස හයක (06) කාලපරිච්ඡේදය තුල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා සමස්ත දළ ලිඛිත වාරික ආදායම රුපියල් බිලියන 43.78 ක් වූ අතර, 2011 වසරේ පළමු මාස 06 හා සසඳන කළ එය 13.45%ක වර්ධනයකි. 2012 පළමු අර්ධය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම, 2011 වසරේ එම කාල පරිච්ඡේදය හා සසඳන කළ පිළිවෙලින් 20.70%ක සහ 4.28%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2012 වසරේ පළමු මාස 06 ඇතුලත සමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රුපියල් බිලියන 26.02ක් වූ අතර (2011 වසර පළමු අර්ධය: රුපියල් බිලියන 21.56 කි), දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා රුපියල් බිලියන 17.76 ක් (2011 පළමු අර්ධය: රුපියල් බිලියන 17. 04 කි) විය.

2011 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සමාගම් වල පැවති මුළු වත්කම් ප්‍රමාණය වූ රුපියල් බිලියන 265.41 ට සාපේක්ෂව 2012 ජූනි 30 දින වන විට එම අගය රුපියල් බිලියන 279.10 දක්වා වැඩි වී ඇත.

පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි තාක්ෂණ සංචිතවල වත්කම් වලින් 20%ක් සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරයන්හි දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල්වල වත්කම් වලින් 30%ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කළ යුතු වේ. මෙය සියලුම රක්ෂණ සමාගම් විසින් අනිවාර්‍යයෙන්ම පිළිපැදිය යුතු අවශ්‍යතාවයකි. 2012 දෙවන කාර්තුව අවසානය වන විට රජයේ සුරැකුම්පත් වල ආයෝජන ප්‍රමාණය; දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල මුළු වත්කම් වලින් 50.21% ක් (2011 පළමු අර්ධය 56.06%) නියෝජනය කල අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල මුළු වත්කම් වලින් නියෝජනය වූ ප්‍රමාණය 29.60% (2011 පළමු අර්ධය 26.50%) කි.

පනතෙහි 98 වන වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගම් විසින් හිමිකම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම් වලට අදාලව රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විමසා බලන ලදී. එම කාලපරිච්ඡේදය ඇතුලත මණ්ඩලය විසින් එවැනි පැමිණිලි 195 ක් සම්බන්ධයෙන් විභාග කරන්නට යෙදුනි.

පනතෙහි 82 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සමග ලියාපදිංචි වී සිටින රක්ෂණ තැරැව්කාර සමාගම් පනහ (50) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි ප්‍රධාන වශයෙන් වැඩි අවධානය යොමු කරමින් වර්තමානයේදී රක්ෂණ තැරැව් ව්‍යාපාරවල නියතව සිටී. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වලින් උත්පාදනය වන මුළු වාරික ආදායම, 2012 වර්ෂයේ පළමු අර්ධය තුල රුපියල් බිලියන 6.31 ක් වූ අතර, එය 2011 එම කාලපරිච්ඡේදය තුල රුපියල් බිලියන 4.94 ක් ව තිබුනි.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
2012 ඔක්තෝබර් 18 දින